# ශ්‍රී ලංකාවේ මධ්‍ය නව යොවුන් වියේ ගැහැනු දරුවන්ගේ වියපත්වීම ආශ්‍රිත සංජානන සහ චර්යා හඳුනා ගැනීමේ අධ්‍යයනයක්


ඒ. එම්. කේ. කේ. ගුණසේකර

ශාස්ත්‍රවේදී විශේෂ (දෙවැනි පෙළ)

පශ්වාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ට)

උපදේශනය පිළිබඳ පශ්වාත් උපාධි ඩිප්ලෝමා (සම්මාන)


98/M.Phil /03

අධ්‍යාපන දර්ශනපති උපාධියේ අවශ්‍යතා

පූරණය කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන

පර්යේෂණාත්මක නිබන්ධනය


UCLIB
509170

University of Colombo Library Sri Lanka



අධ්‍යාපන පීඨය,

කොළඹ විශ්ව විද්‍යාලය,

කොළඹ 03.



2001 ජූනි

# සංක්ෂිප්තය

සමාජයක පූර්ණ සාමාජිකයෙකු ලෙස පිළිගැනීමට යෝග්‍ය වන අන්දමින් හැඩ ගැසීමෙහි ලා ඉතා වැදගත් අවධියක් ලෙස නවයෞවනය හැඳින්විය හැකිය. පුරාණ සමාජයෙහි කෙටි කාලයකට සීමා වූ නව යෞවනය යෞවනියන්ට එතරම් දුෂ්කරතාවක් නොවූ නමුදු, අද තත්ත්වය ඊට වෙනස්ය. වත්මන් සමාජයේ යෞවනය දිගු කාලයකට ව්‍යාප්ත වී ඇති අතරම කරදරකාරී සමයක් බවටද පත් වී ඇත. වියපත් වන අවධියේදී යෞවනියන්ට කායික, මානසික, ලිංගික, චිත්තවේගික හා සමාජයීය වශයෙන් විපර්යාසයන් රාශියකට මුහුණ පෑමට සිදුවේ. එම තත්ත්වයන් පිළිබඳ නිසි ආකාර අවබෝධයක් නොමැතිවීම හේතුවෙන් වඩාත් ගැටලු මතු වන බව පෙනේ. වර්තමාන සංකීර්ණ සමාජය තුළ විවිධ සමාජ කණ්ඩායම් විසින් එනම් දෙමාපියන්, වැඩිහිටියන්, ගුරුවරුන් හා සමවයස් කණ්ඩායම් විසින් එල්ල කරන පීඩාවන්ද හේතු කොට ගෙන, එම ගැටලු තව තවත් වර්ධනය වීමක් දක්නට ලැබේ.

අධ්‍යයනයෙන් ප්‍රයත්න දරා ඇත්තේ, ශ්‍රී ලංකාවේ මධ්‍ය නව යෞවනියේ ගැහැනු දරුවන් වියපත්වීම සංජානනය කර ගෙන ඇති ආකාරය සහ ඒ ආශ්‍රිතව ඔවුන් තුළ ඇතිවන චර්යා රටා අවබෝධ කර ගැනීමට හා ඒ සම්බන්ධයෙන් ඔවුන් තුළ ඇතිවන ගැටලු සහගත තත්ත්වයන් පිළිබඳ සොයා බැලීමටය. මෙහිදී මධ්‍ය නව යෞවනියන්ගේ වියපත්වීම ආශ්‍රිත කායික සංසිද්ධිය පිළිබඳ දැනුම, එම දැනුම ඔස්සේ ඔවුන්ගේ චිත්තවේගික ප්‍රතිචාර, ආවේදනික ප්‍රතිචාර, ආකල්ප මෙන්ම ඔවුන් තුළ ඇතිවන චර්යා රටා විශේෂයෙන් ලිංගික අංශයට බරවීම පිළිබඳව පරීක්‍ෂා කෙරේ.

පර්යේෂණ කාර්යය සඳහා තෝරා ගනු ලැබුවේ අධ්‍යාපන නරතකාරිත්වයෙන් යුක්ත දිස්ත්‍රික්කයක් වන කළුතර දිස්ත්‍රික්කයයි. මෙහිදී සමාජ ආර්ථික තත්ත්වය, ග්‍රාමීය නාගරික බව, ජනවාර්ගික බව, වියපත්වීමේ කාල පරාසය හා පාසල් වර්ගය යන විචල්‍යයන් නියෝජනය වන ආකාරයට ස්තරගත අහඹු නියැදිකරණය අනුව කළුතර දිස්ත්‍රික්කයෙන් පාසල් 10 ක් තෝරා ගෙන, ඒවායින් ශිෂ්‍යාවන් 250 ක් අධ්‍යයන කාර්යය සඳහා යොමු කෙරිණ. මෙයින් 150 ක් සිංහල, 50 ක් දෙමළ, 50 ක් මුස්ලිම් යන ජන වාර්ගික කණ්ඩායම් වලට අයත් වූහ.

දත්ත සපයා ගන්නා ලද්දේ ප්‍රශ්නාවලියක්, ආකල්ප පරිමාණයක් හා සම්මුඛ සාකච්ඡා මාර්ගයෙනි. ප්‍රශ්න 48 කින් යුක්ත ප්‍රශ්නාවලියක් මගින් යෞවනියන්ගේ කායික

සංසිද්ධිය පිළිබඳ දැනුම මෙන්ම චර්යා රටාවන්ද (චර්යා රටා මැනීමට වෙනත් ක්‍රමද අනුගමනය කරන ලදී.) මනින ලද අතර, ආකල්ප පරිමාණයෙන් ඔවුන්ගේ චිත්තවේගික ප්‍රතිචාර, ආවේදනික ප්‍රතිචාර හා ආකල්ප පරීක්ෂා කරන ලදී. ආකල්ප පරිමාණය උප පරිමාණ 08 ක් ඔස්සේ පරීක්ෂණාංග 80 කින් යුක්ත විය. එම මිනුම් පරිමාණවල වලංගුතාව පරීක්ෂා කිරීමේ අභිප්‍රායෙන් පූර්ව පරීක්ෂණයක්ද, ඒවායේ පරිපූරකයක් වශයෙන් ශිෂ්‍යාවන්, දෙමාපියන්, ගුරුවරුන් හා ක්ෂෙත්‍රයේ විශේෂඥයන් සමග සම්මුඛ සාකච්ඡාද උපයෝගී කර ගන්නා ලදී. මෙහිදී එක් එක් අරමුණු ඔස්සේ ගැටලු ක්ෂෙත්‍ර වෙත් කර දත්ත ලබා ගන්නා ලදී.

දත්ත විශ්ලේෂණයේදී ප්‍රශ්නාවලියට ශිෂ්‍යාවන් දක්වා තිබූ ප්‍රතිචාරයන් අනු අරමුණු (සමාජ ආර්ථික තත්ත්වය, ග්‍රාමීය නාගරික බව, වියපත්වීමේ වයස් පරතරය, ජනවාර්ගික බව හා පාසල් වර්ගය) යටතේ වගු, ප්‍රතිශත වගු හා ප්‍රස්තාර ඔස්සේ විග්‍රහ කෙරිණ. ආකල්ප පරිමාණයට ශිෂ්‍යාවන් දක්වා තිබූ ප්‍රතිචාරද අනු අරමුණු ඔස්සේ, උප පරිමාණ යටතේ කයි වර්ග පරීක්ෂාවට භාජන කරන ලදී. එහිදී කල්පිත 40 ක් පරීක්ෂාවට භාජන විය.

අනතුරුව දත්ත අර්ථ කථනය හා අනාවරණ ඉදිරිපත් කර ඇත. එහිදීද ප්‍රශ්නාවලියෙන් හා ආකල්ප පරිමාණයෙන් ලබා ගන්නා ලද දත්ත ඔස්සේ වියපත්වීම සංජානනය තෝරාගත් විචල්‍යය අනුව වෙනස් වන්නේද යන්න සාකච්ඡාවට ලක් කරන ලදී.

දත්ත අර්ථකථනය අනුව ලද අනාවරණයන් තෝරා ගත් විචල්‍ය අනුව සංක්ෂේපයෙන් මෙසේ දැක්විය හැකිය. සමාජ ආර්ථික තත්ත්වය අනුව පන්ති භේදයකින් තොරව සියලුම යෞවනියන්ගේ කායික සංසිද්ධිය පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවන බව පෙනුණද, මැද පන්තියේ යෞවනියන් අන් අයට සාපේක්ෂව ඉදිරියෙන් සිටි බව අනාවරණය විය. යෞවනියන්ගේ චර්යා රටා විමසීමේදී ඉහල පන්තියේ දැරියන් ලිංගික අංශයට නැඹුරු වීමේ වැඩි ප්‍රවණතාවක් දක්නට ලැබුණි. වියපත්වීම ආශ්‍රිතව චිත්තවේගික, ආවේදනික හා ආකල්ප පිළිබඳ අඩුම ධනාත්මක සංජානනයක් දක්නට ලැබුණේද ඉහල පන්තියේ යෞවනියන් තුලයි.

ග්‍රාමීය නාගරික බව අනුව නාගරික දැරියන් තුළ අන් අයට සාපේක්ෂව වැඩි දැනුම් සම්භාරයක්ද ලිංගික අංශයට නැඹුරු වීමේ ප්‍රවණතාවක්ද දක්නට ලැබුණි. එසේම

වියපත්වීම ආශ්‍රිත චිත්තවේගික, ආවේදනික මෙන්ම ආකල්පමය සංජානනයන් ඇසුරින් අවම ධනාත්මක සංජානනය දක්නට ලැබුණේද නාගරික යෞවනියන් තුළය.

ජනවාර්ගික බව වියපත්වීම සංජානනය කෙරෙහි යම් ආකාරයකට බලපා ඇති බව පෙනුණි. සියලුම යෞවනියන්ගේ සමස්ත දැනුම බලනවිට ප්‍රමාණවත් නොවන බව පෙනී ගිය අතර, එම දැනුවත්භාවය කෙරෙහි ඔවුන් ජීවත් වන පරිසරය හා සමාජ කණ්ඩායම් බලපාන බව අනාවරණය විය. වියපත්වීමත් සමග ලිංගික චර්යා කෙරෙහි යොමුවීම පිළිබඳව ජාතීන් අතර කැපී පෙනෙන වෙනසක් දක්නට ලැබුණ අතර, වැඩි නැඹුරුවක් පෙන්නුම් කලේ සිංහල තරුණියන්ය. එසේම සිංහල තරුණියන් වියපත්වීමත් සමග ආවේදනික චිත්තවේගික හා ආකල්පමය වශයෙන් ඍණාත්මක සංජානනයක් පවතින බව පෙන්නුම් කර තිබුණි.

පාසල් වර්ගය අනුව බලනවිට 1 ඒබී පාසල්වල දැරියන් වියපත්වීම ආශ්‍රිත දැනුවත් භාවයෙන් අන් අයට සාපේක්ෂව ඉහලින් සිටි අතරම ඔවුන් තුළ ලිංගික අංශයට නැඹුරුවීමේ ප්‍රවණතාවක්ද දක්නට ලැබුණි. මෙහිදී ආවේදනික, චිත්තවේගික හා ආකල්පමය වශයෙන් ඍණාත්මක සංජානනයන් ඇතිව සිටියේ 1සී පාසල්වල යෞවනියන්ය.

වියපත්වීමේ කාල පරාසය අනුව බලනවිට තිසි වයසට පෙර වියපත් දැරියන් වියපත්වීම ආශ්‍රිත දැනුමින්ද, එම දැනුම ඔස්සේ ඇතිවන ආවේදනික, චිත්තවේගික හා ආකල්පමය වශයෙන් ධනාත්මක සංජානනයන් පෙන්නුම් කර තිබුන නමුදු, වියපත් වීමත් සමග අන් අයට සාපේක්ෂව ඔවුන් ලිංගික අංශයට නැඹුරුවීමේ ප්‍රවණතාවක් දක්නට ලැබුණි.

අනාවරණයන් අනුව එළඹි නිගමන හා යෝජනා සාපේක්ෂ වශයෙන් මෙසේ වේ. ලාංකික මධ්‍ය නව යොවුන් වියේ ශිෂ්‍යාවන්ගේ වියපත්වීම ආශ්‍රිත කායික සංසිද්ධිය පිළිබඳ දැනුම සමස්තයක් වශයෙන් අඩු බව පැහැදිලිව නිගමනය කළ හැකිය. ඔවුන්ගේ චර්යා රටාවන් ලිංගික අංශයට නැඹුරුවීමේ ප්‍රවණතාවක්ද දක්නට ලැබුණි. වියපත්වීම ආශ්‍රිත සංජානනයන් තෝරාගත් විචල්‍ය වල බලපෑමෙන් තොරව සිදුවන බව නිගමනය කළ හැකිවිය. සියලුම සංජානන සමස්ත ලෙස ගත් කළ පවුල පිළිබඳ අන්තර් ක්‍රියාකාරිත්වය, සමාජ සම්බන්ධතා, සම වයස් කණ්ඩායම්, අනාගත අපේක්ෂණ, ලිංගිකත්වය පිළිබඳව තෝරාගත් විචල්‍ය වල බලපෑමෙන් තොරව සියලුම යෞවනියන් ධනාත්මකවද, චිත්තවේගික ස්ථාවරත්වය, කායික පෙනුම හා ලිංගික ස්ව-සංකල්පය ඍණාත්මකවද සංජානනය කර

University of Colombo Library Sri Lanka

තිබූ බව නිගමනය කළ හැකිය. එම සංජානන කෙරෙහි පවුල විශේෂයෙන් දෙමාපියන්, වැඩිහිටියන් හා සම වයස් කණ්ඩායම් විශේෂ බලපෑමක් කරන බව දක්නට ලැබිණ.

වියපත්වීම ආශ්‍රිත යෞවනියන්ගෙන් ලද ප්‍රතිචාර මෙන්ම, දෙමාපිය, ගුරුවරු හා ක්ෂෙත්‍රයේ විශේෂඥයන්ගෙන් ලද තොරතුරු වලින්ද නිගමනය කළ හැකි වූයේ, යෞවනියන්ට වියපත්වීම ආශ්‍රිත විශාල ගැටලු ප්‍රමාණයක් මතුවන බවය. එම ගැටලු අවම කර ගැනීම සඳහා යෝජනා විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් කෙරුණ අතර පාසල් උපදේශන සේවා අවශ්‍යතාව පැහැදිලිව මතුවී ඇති බව පෙනුණි.

නූතන සංකීර්ණ සමාජ ක්‍රමය තුළ අතීතයේ පවුල වෙතින් ළමයා වැඩිහිටි වියට පුහුණු කිරීම සම්බන්ධයෙන් ඉටුවූ වගකීම් සම්භාරය ගිලිහී ගොස් ඇති බැවින්, එම හිඩැස පිරවීමේ අවශ්‍යතාව මැනවින් පැහැදිලි විය. එහෙයින් අධ්‍යාපනික ක්‍රියාවලිය මගින් නව යොවුන්විය කායික, මානසික, චිත්තවේගික, සමාජමය, ලිංගික හා සදාචාරමය වර්ධන ක්ෂෙත්‍රයන්හි ප්‍රවර්ධනය සඳහා අනිවාර්ය වැඩ පිළිවෙළක් මුළු මහත් අධ්‍යාපන ක්‍රියාවලිය තුළම සංවිධානය කළ යුතුය. එමගින් පාසල් සිසුවියන් සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩ සටහන්, දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩ සටහන් හා ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුය.